**කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**ශාස්ත්‍ර පීඨය**

**ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි දෙවන වසර පරීක්ෂණය**

**පළමු සෙමෙස්තරය 2018**

**CMS 2112 - මුද්‍රිත මාධ්‍ය: වාර්තාකරණය සහ සංස්කරණය**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න** **කාලය පැය දෙකයි**

---

1. 'ප්‍රවෘත්ති' පිළිබඳ ව මෙතුවක් ප්‍රකාශිත නිර්වචන මගින් ප්‍රවෘත්ති සංකල්පය පිළිබඳ පූර්ණ අවබෝධයක් අත්පත් කර ගත හැකි ය' පක්ෂ ව හෝ විපක්ෂ ව කරුණු දක්වන්න.

*(ලකුණු 20)*

2. දිනපතා පුවත්පතක කර්තෘ මණ්ඩල ව්‍යුහය හඳුන්වා දී සෙසු අංශවලට සාපේක්ෂ ව ප්‍රවෘත්ති අංශයේ වැදගත්කම පෙන්වා දෙන්න.

*(ලකුණු 20)*

3. අන් සෑම ජනමාධ්‍යයක් සේ ම පුවත්පත ද පළ කිරීම සඳහා ප්‍රවෘත්ති තෝරයි. වැඩි ම ග්‍රාහක අවධානය දිනාගත හැකි අයුරින් ප්‍රවෘත්ති තේරීමේදී භාවිත කරන නිර්ණායක පහක් (05) නිදර්ශන සහිත ව විස්තර කරන්න.

*(ලකුණු 20)*

4. 'ප්‍රවෘත්තියක් වාර්තා කළ යුත්තේ පාඨකයාට ප්‍රශ්නයක් ඉතිරි නොවන අයුරිනි'. මේ කියමන විවරණය කරන්න.

*(ලකුණු 20)*

*(අනෙක් පිටුවට)*

5. ප්‍රවෘත්ති වාර්තාකරණයේදී ජනමාධ්‍යවේදීන් අනුගමනය කළ යුතු මූලික ප්‍රතිපත්ති රාමුවක් පවතී. මෙරට සෘජු හා වක්‍ර නියාමන ක්‍රමවේද කෙරෙහි සාවධාන ව සාකච්ඡා කරන්න.

*(ලකුණු 20)*

6. මුද්‍රිත මාධ්‍යයේදී ප්‍රවෘත්ති සංස්කරණයෙන් අපේක්ෂිත අරමුණු මොනවාදැයි පැහැදිලි කොට සංස්කරණ කාර්යය පුවත්පතකට අත්‍යවශ්‍ය වන්නේ මන්දැයි විග්‍රහ කොට දක්වන්න.

*(ලකුණු 20)*

7. නව තාක්ෂණික ප්‍රවණතා පුවත්පත් මාධ්‍යයේ වාර්තාකරණ රටාව කෙරෙහි සිදු කර ඇති බලපෑම අලළා විශ්ලේෂණාත්මක රචනයක් සම්පාදනය කරන්න.

*(ලකුණු 20)*